**මාධ්‍ය නිවේදනය**
කොළඹ, 2017 ජුලි 13

Nestlé
Good Food, Good Life

# Mom, Me and My *Milo* ප්‍රවර්ධන වැඩසටහනට අති විශාල අයදුම්පත් ප්‍රමාණයක්

*මව්වරුන් හා දරුවන් එකට එක් කරමින්, ප්‍රවර්ධන වැඩසටහනට ලැබෙන ඉහළ ප්‍රතිචාර මගින් මයිලෝ ගැන මව්වරුන්ගේ විශ්වාසය තහවුරු කරයි*

පසුගිය වසර දෙක තුළ දියත් කළ Mom, Me and My *Milo* ප්‍රවර්ධන වැඩසටහනෙහි ඉමහත් සාර්ථකත්වය තවත් ශක්තිමත් කරමින්, මයිලෝ නැවතත් එහි වැදගත්ම පාර්ශවකරුවන් වන මව්වරුන් හා දරුවන් එකට එක්රැස් කරගනී. එමගින් ඔවුන්ගේ සබැඳියාව වැඩි කිරීමටත්, එකමුතුව ක්‍රියාශීලී ජීවන රටාවක් විඳීමටත් මයිලෝ සැලසුම් කර ඇත.

ජනප්‍රිය සෙල්ෆි රැල්ල හා අනුගත වෙමින් හඳුන්වා දුන් මෙම ප්‍රවර්ධන වැඩසටහනේ කුසපත් ඇදීමට ඇතුලත් වීමට මව හා දරුවා මයිලෝ පැකට්ටුවක් සමඟ ගත් සෙල්ෆි ඡායාරූපයක් ගෙන එවිය යුතු විය. එහිදී තෝරාගන්නා වාසනාවන්ත ජයග්‍රාහකයින් 1,000කට විශේෂ මයිලෝ පාපැදි දිනාගැනීමේ අවස්ථාවක් ලැබේ.

මේ වසරේදී මෙම ප්‍රවර්ධන වැඩසටහන සඳහා ලැබුණු පාරිභෝගික ප්‍රතිචාර ඉතා ඉහළය. එය, පසුගිය වසර දෙකක කාලය තුළ ලැබුණු විශාල අයදුම්පත් සංඛ්‍යාවටත් වඩා අධිකය. නෝමන් කන්නන්ගර මහතා, නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති - පාන වර්ග, සඳහන් කළේ මේ මඟින් පාරිභෝගිකයින් තුළ මයිලෝ කෙරෙහි ඇති විශ්වාසය සහ ඇගයීම පෙන්නුම් කරන බවයි.

"අපි පාරිභෝගිකයා කේන්ද්‍ර කරගෙන සෑම කටයුත්තකම යෙදී ඇත. තවද, ක්‍රියාශීලී ජීවිතයක විනෝදය සමඟ මව්වරුන් හා දරුවන් අතර තිබෙන සබැඳියාව වැඩි කිරීමට සහ ඒවා අගය කිරීමට අළුත් මාවත් හඳුන්වා දීමට හැකිවීම ගැන අපි ආඩම්බර වෙනවා. මේ වසරේදී ලැබුණු අති විශාල අයදුම්පත් ප්‍රමාණයෙන් පැහැදිලි වන්නේ මයිලෝ කෙරෙහි පාරිභෝගිකයින් තුළ පවතින ඇගැයීම හා විශ්වාසයයි. ප්‍රවර්ධන වැඩසටහනේ මීළඟ අදියර හරහා, අපි ඔවුන් කොයිතරම් අගය කරනවාදැයි පෙන්වාදීමට අපි ඉදිරියටත් බලාපොරොත්තු වෙනවා"

ප්‍රවර්ධන වැඩසටහන හරහා බිහිවූ ජයග්‍රාහකයින් 1,000, ඉදිරි සති කිහිපය තුළදී ප්‍රකාශයට පත්කිරීමට නියමිත යි. පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයට නිරන්තරයෙන් සහාය දෙන සහ ක්‍රියාශීලී ජීවන රටාවකට හුරුවීමට ළමුන්ව දිරිගන්වන සන්නාමයක් ලෙස මයිලෝ, ක්‍රියාශීලී වීම විනෝදජනක ද විය හැකි බව ළමුන්ට අවබෝධ කරදීමට බලාපොරොත්තු වේ. තවද මෙම ප්‍රවර්ධන වැඩසටහනේ ජයග්‍රාහකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් එක් කරගනිමින්, අගෝස්තු මාසයේදී දැවැන්ත පා පැදි පෙළපාලියක් පැවැත්වීමට ද අපේක්ෂිත ය.

මෙම වැඩසටහන නිර්මාණය කර ඇත්තේ ඉතා සුවිශේෂී මෙන්ම අද්විතීය අත්දැකීමක් ලබා දීමටය. එය තුළින් දරුවන්ට ජයග්‍රහණය සැමරීමට සහ මව්වරුන් සමඟ බැඳියාව වර්ධනය කිරීමට සහයෝගය දෙනු ලබන අතර, විවිධ විනෝද ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් ඔස්සේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක වැදගත්කමද ඔවුන්ට හඳුන්වාදෙනු ඇත. මෙම වැඩසටහනේදී දරුවන්ට හා දෙමාපියන්ට උදෑසන ආහාරවේලෙහි වැදගත්කම කියා දෙනු ලබන අතර සෑම

දිනකම පෝෂදායී උදෑසන ආහාර වේලක් ලබා ගැනීමට පොරොන්දු වීමට ඔවුන්ව උනන්දු කරනු ලැබේ.

රට පුරා සිටින 20,000ක පමණ කිරි ගොවීන්ගෙන් ලබාගන්නා දේශීය නැවුම් කිරිවල යහගුණය සහ මෝල්ටඩ් බාර්ලි යොදා නිෂ්පාදනය කරන මයිලෝ, යකඩ, විටමින් බී සහ කැල්සියම් ගුණයෙන් අනූන වේ. එය කුරුණෑගල පිහිටි නෙස්ලේ සමාගමට අයත් නවීන කර්මාන්තශාලාවෙහි, ලොව පුරා ප්‍රසිද්ධියට පත් නෙස්ලේ උසස් ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූලව නිපදවනු ලැබේ.